සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

දෙවන වාර විභාගය - 2018
# Second Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 9 | විෂයය / பாடம் / Subject | Christianity | පත්‍රය / வினாத்தாள் / Paper | I/II | පැය / மணித்தியாலம் / Hours | 02 |
|---|---|---|---|---|---|---|---|

**සැලකිය යුතුයි**

(i) සියලුමප්‍රශ්න වල පිළිතුරු සපයන්න

(ii) අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරා ගන්න

1 වනකොටස

1) <u>වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.</u>

1) මැවිල්ලේ මුදුන්මල්කඩ ලෙස හඳුන්වන්නේ……………. ,
   1. දෙවියන්වහන්සේ ව  2. මනුෂ්‍යයා ව  3.සාතන් ව  4 සතුන් ව

2) දේව සබඳතාව සහිතව ජීවත්වූ දැහැමි මිනිසා,
   1. ආදම්  2.ආබ්‍රහම්  3.නෝවා  4.මෝසෙස්

3) "දෙවියන්වහන්සේ, දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී පොළොව පුරා පැතිර, පාලනය කිරීමට.................."පැවසු සේක. මෙම පාඨය සඳහන් ග්‍රන්ථය වන්නේ,
   1. උත්පත්ති  2. නික්මයාම  3. ගීතාවලීය  4. ජොහාන්

4) "අප පරීක්ෂාවට නොපමුණුවා අප ගලවා ගත මැනව" මෙම වදන සඳහන් යාච්ඤාව වන්නේ,
   1. උත්තම පූජක යැදුම  2. ගෙත්සමන යැදුම  3. සමිඳුන්ගේ යැදුම  4. මැදහත් යැදුම

5) ඉශ්‍රායෙල් ඉතිහාසයේ පළමුවන රජතුමා වන්නේ,
   1. සාවුල් රජ  2. හේරෝද් රජ  3. දාවිත් රජ  4. සලමොන් රජ

6) ශු බයිබලයේ දාවිත්ව හඳුන්වන්නේ,
   1. ගොවියෙක්  2. රජෙක්  3. කුඩාරම් තනන්නෙක්  4. බැටළු එඬේරෙක්

7) රොටි හතක් හා මසුන් ස්වල්පයකින් ජේසුස්වහන්සේ පෝෂණය කළ මිනිසුන් සංඛ්‍යාව වන්නේ,
   1. 3000  2. 4000  3. 5000  4. 2000

8) පලස්තීනය යටත් කර ගත් අධිරාජ්‍යයා වූයේ,
   1. ලන්දේසි  2. පෘතුගීසි  3. බ්‍රිතාන්‍යය  4. රෝම

9) ජේසුස්වහන්සේ තම ප්‍රථම හාස්කම සිදු කරනු ලැබුවේ,

1. 1.කානාහි දී 2. ජොර්දන්හි දී 3. නාසරෙත්හි දී 4. ගලීලයේ දී

10) ස්තේපන්ට ගල් ගැසූ තරුණයන්ගේ ඇඳුම් රැක බලා ගත්තේ,

1. පිලිප් 2. පේදුරු 3. සාවුල් 4. තිමෝති

11) සාවුල් හෙවත් පාවුල්ගේ හැරීම සිදුවූ නගරය වන්නේ,

1. ජෙරුසලම 2. පිලිප්පීය 3.කෝරින්තිය 4. දමස්කය

12) "සියල්ල දේව ගෞරවය උදෙසා කළයුතු බව"සඳහන් වන හසුන වන්නේ,

1. කොරින්ති හසුන 2. එපීස හසුන 3. ගලාති හසුන 4. 1 තෙසලෝනික හසුන

13) සමිඳුන්ගේ දීමනාවකි,

1. ප්‍රේමය 2. සාමය 3. ප්‍රඥාව 4. කරුණාව

14) අන්තර්ජාලය භාවිතා කරමින් පවත්වාගෙන යනු ලබන්නේ,

1. 'ලියුම්' 2.' මුහුණුපොත' 3. 'ෆැක්ස් ' 4. 'රූපවාහිණිය'

15) "දෙවියන්වහන්සේ අප කැඳවනු ලැබුවේ අපවිත්‍රකමට නොව....................."මෙහි හිස් තැනට සුදුසු වචනය වන්නේ,

1. ධර්මිෂ්ඨකමට ය 2. ප්‍රේම කිරීමට ය 3. තෘෂ්ණාවට ය 4. පවිත්‍රකමට ය

16) "ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව"ලෙස හඳුන්වන්නේ,

1. දේවස්ථානය 2. මිනිසා 3. සභාව 4. මැවිල්ල

17) සබත් දින සුවය ලැබූ තැනැත්තෙකි,

1. අත පණ නැති මිනිසා 2. යක්ෂාවේෂවූ තැනැත්තා
3. පේදුරුගේ නැන්දණිය 4. මහලේ රෝගී කාන්තාව

18) ජොනතන්ගේ පුත්‍රයාවන්නේ,

1. බැත්ෂෙබා 2. මෙපීබොෂෙත් 3. ආරොන් 4. රෙහොබෝවම්

19) ජුදෙව්වන් විවාහ මංගල්‍යයන් පැවැත්වූයේ,

1. දින 4ක් පුරා 2. දින 5ක් පුරා 3. දින 7ක් පුරා 4. දින 9ක් පුරා

20) දෙවියන්වහන්සේගේ සාක්ෂිකරුවන් ලෙස වර්තමානයේ ජීවත් වීමට නම් අප ,

1. සෑම දිනකම පල්ලි යා යුතුයි
2. ලංකාව පුරා පෝස්ටර් අලවා දේව වචනය ඉගැන්විය යුතුයි
3. ශුද්ධාත්මයාණන්ගෙන් සවිය ලබා දේව මෙහෙවරට යොමු විය යුතුයි
4. දිවැසි වැකි හා හාස්කම් පිළිබඳ පමණක් විශ්වාස කළ යුතුයි

ලකුණු*(2 20 = 40)*

## 2 වනකොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න. පළමු ප්‍රශ්නය අනිවාර්යයි, සම්පූර්ණ ප්‍රශ්න 5යි

01) <u>කෙටි පිළිතුරු ලියන්න</u>

1) "ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ වෙත පැමිණි කළ ඔබ බලය ලබන්නහුය" ජේසුස්වහන්සේ මෙම පොරොන්දුව දුන්නේ කුමන අවස්ථාවේදී ද?

2) ශ්‍රාවකයන් ඇතුළු මුල්සභාව ශුද්ධාත්ම බලය ලැබූ දිනය කවදාද?

3) ශුද්ධාත්මදානය ලැබීමෙන් පසු ශ්‍රාවකයන් සිදු කළ පළමු බලවත් ක්‍රියාව කුමක්ද? එය කළේ කොහේදීද?

4) ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වු ගෝලයන්ට පැවරුණු වගකීම් 2ක් ලියන්න.

5) ගෝලයන්ට දඬුවම් කරමින් පැණවු අණ කුමක්ද?

6) ජේසුස්වහන්සේ අප වෙත හෙළි කළ 'ජීවනමඟ' වුයේ කුමක්ද?

7) ශුද්ධාත්මබලයෙන් මරණින් නැගිටුණු තරුණිය සිටියේ කොහේද? ඇයව මරණින් උත්ථාන කළ ශ්‍රාවකයා කවුද?

8) 'දොර්කස් 'යන්නෙහි අර්ථය කුමක්ද?

9) උපස්ථායිකයින් පත් කළේ ඇයි ?

10) ශුද්ධාත්ම බලය ලද ගෝලයන්ගේ ජීවිත වලින් ඔබට ගත හැකි ආදර්ශ 2ක් ලියන්න.

***(2 10 = 20)***

2) <u>දේව බලය තුළින් පෝෂණය ලබමු</u>

1) එළියා දිවැසිවරයා පෝෂණය වු ක්‍රම 2ක් ලියන්න. 2
2) හාරදහසකට ආහාර සැපයීමේ කතාව කෙටියෙන් ලියන්න. 3
3) අපගේ පාසලේ හෝ අපගේ සමාජයේ අවශ්‍යතාවයන් ඇති අය වෙනුවෙන් ඔබට ක්‍රියා කළ හැකි අවස්ථා 5ක් ලියන්න. 5

3) <u>දෙවිඳුන් සමඟ සමීපතාවයට යොමු වෙමු</u>

1) කිතුනු දිවියේ වැදගත්ම සන්නිවේදන මාධ්‍යය කුමක්ද? 2
2) ජේසුස්වහන්සේ තම ජීවිතයේ යාච්ඤාව අදාළ කරගත් අවස්ථා 3ක් සඳහන් කරන්න 3
3) අසනීපයෙන් සිටින මිතුරියක් /මිතුරෙකුට සුවය පතා දෙවිඳුන් වෙත කෙරෙන යැඳුමක් ලියන්න 5

4) <u>දැහැමි සිතින් දිවි ගෙවමු</u>

1) ශුද්ධ බයිබලයේ අඛණ්ඩ ව දිවෙන තේමාව කුමක්ද? 2
2) දාවිත් රජ තුළින් පිළිඹිබු වු යහපත් ගුණාංග 3ක් ලියන්න 3
3) කිතුනු දරුවෙකු ලෙස ඔබ සමඟ ජීවත් වන අයට ප්‍රේමයෙන් ක්‍රියා කරන අවස්ථා 5ක් ලියා දක්වන්න. 5

5) පීඩා මැද ශුද්ධාත්ම බලය අත්දකිමු

1) කිතුනු සභාව වෙනුවෙන් ප්‍රථමයෙන් තම දිවි පිදූ වේද සාක්ෂිකයා කවුද? 2

2) මුල් කිතුනු සභාව මුහුණ දුන් පීඩා 3ක් සඳහන් කරන්න 3

3) ස්තේපන් තුමාගේ ජීවිතයෙන් ඉස්මතු වූ ගුණාංග 2ක් ලියා එයින් ඔබේ ජීවිතයට ලැබෙන මඟ පෙන්වීම් 3ක් ලියන්න 5

6)දෙවිඳුන් තුළ යහපත් දැක්මකට යොමු වෙමු

1) "ධර්ම දේශකයා විපත් පැමිණෙන විට යොවුන් වියේදී සිහි කරන්නැයි"පවසන්නේ කවුරුන්ව ද? 2

2) මාංශික තෘෂ්ණා 4ක් ලියන්න 3

3) මාංශික තෘෂ්ණා නිසා ඇතිවන ගැටළු තත්වයන් 2ක් ලියා ඒවා අත් හැරීමට ගත හැකි පියවර 3ක් ලියන්න 5

7) පහත සඳහන් වන මාතෘකා 2ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න

- ලෝකය මැවීම
- නෝවාගේ නැව හා ජල ගැල්ම
- කානාහි සරණ මංගල්‍යය
- ජේසුස් වහන්සේගේ සුවකිරීමේ මෙහෙය *(2  10 = 20)*